01. වසමෙහි නම: 784A - ගොරකදූව

02. හැඳින්වීම :

වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් 784 - A ගොරකදූව ග්‍රාම නිලධාරී වසමකි. මෙහි විශේෂත්වය වනුයේ කළුතර දිස්ත්‍රික්කයේ මායිම හා පළාත් මායිම වෙන් කරනු ලබන ගමයි. එම වෙන්වීම මායිම් කරනුයේ බෙන්තර ගඟ මගිනි.

03. නම සැදුණු ආකාරය :

පොදුවේ කරපාගල ලෙසින් හැඳින්වූ මෙම ග්‍රාමය 1960 වර්ෂයෙන් පසුව (ග්‍රාම සේවා වසම් මට්ටමින් බෙදන කල) ගොරකදූව ලෙසින් භාවිතා කරන්නට විය. මෙම ප්‍රදේශය ගොරකවලින් පිරුණු දූවක් හෙවත් කලවිටක් නිසා ගොරකදූව නම් විය.

04. මායිම් :

උතුර	:	ගම්මන ග්‍රාම නිලධාරී වසම
දකුණ	:	උඩුගම ග්‍රාම නිලධාරී වසම
නැගෙනහිර	:	කරපාගල ග්‍රාම නිලධාරී වසම
බටහිර	:	බෙන්තර ගංගා සීමාව

05. ගමන් මාර්ගය :

I. **ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිට :**

අවිත්තාව මාර්ගයේ අවිත්තාව පසුකර 2 km යන විට ප්‍රධාන මාර්ගය දෙපසට වසම විහිදී ඇත.

II. **ඇල්පිටිය සිට :**

අවිත්තාවට පැමිණ ලෙව්වන්දූව මාර්ගයට හරවා පාලම පසුකර 2 km ගිය විට ප්‍රධාන මාර්ගය දෙසට විහිදී ඇත.

III. **අධිවේගී මාර්ගයේ වැලිපැන්න පිවිසුමේ සිට :**

ලෙව්වන්දූව හන්දියට පැමිණ අවිත්තාව මාර්ගයෙන් 9km දුරක් පැමිණි විට ප්‍රධාන මාර්ගය දෙපසට විහිදී ඇත.

IV. **අළුත්ගම සිට :**

දර්ගා නගරයෙන් මීගමට පැමිණ ඉත්තෑපාන හන්දියෙන් දකුණට අවිත්තාව මාර්ගයේ 4km දුරක් පැමිණි විට මාර්ගය දෙපසට විහිදී ඇත.

06. භූමියේ ස්වභාවය :

- කඳු සහිත, බෙන්තර ගඟ කඩොලාන
- වගුරු බිම් සහිත
- ගංගා මිටියාවතක් සහිත භූමියකි.
- ලෝම හා මැටි පසකි.

07. ජනගහන තොරතුරු : (මුළු ජනගහනය)

ජනවර්ගය අනුව

ජාතිය	ස්ත්‍රී	පුරුෂ
සිංහල	549	526
දෙමළ	-	-
මුස්ලිම්	-	-
වෙනත්	-	-
එකතුව	**549**	**526**

ආගම් අනුව

ආගම්	ස්ත්‍රී	පුරුෂ
බෞද්ධ	549	526
හින්දු	-	-
ක්‍රිස්තියානි	-	-
ඉස්ලාම්	-	-
වෙනත්	-	-
එකතුව	**549**	**526**

වයස් කාණ්ඩ අනුව

වයස් කාණ්ඩය	ස්ත්‍රී	පුරුෂ
අවු 05 ට අඩු	48	43
අවු. 05 - අවු. 14 දක්වා	92	86
අවු. 15 - අවු. 18 දක්වා	31	27
අවු. 19 - අවු. 30 දක්වා	101	98
අවු. 30 - අවු. 60 දක්වා	201	198
අවු 60 ට වැඩි	76	74
එකතුව	**549**	**526**